# හෝඩුවාවන් 8

# ඔබට ගංවතුර සඳහා සූදානම්වීමට කල හැකි දේ

**1** අවදානය ගැන දැනුවත් වන්න




**2** යා යුත්තේ කොහේද යන්න අවබෝධයෙන් සිටින්න



**3** කථා කල යුත්තේ කා හටද යන්න දැනගෙන සිටින්න




**4** ඔබගේ සැලැස්ම අන් අය සමඟ බෙදා හදා ගන්න



**5** මූලික ආපදා කට්ටලයක් පිළියෙල කර ගන්න




**6** ක්‍රියා කල යුතු අවස්ථාව දැන ගන්න



**7** ඔබගේ රක්ෂණය සෝදිසි කර බලන්න




**8** ඔබගේ පළාතේ ගුවන් විදුලි මධ්‍යස්ථානයට සවන් දෙන්න



SES
NSW STATE EMERGENCY SERVICE

Sinhalese

# ගංවතුර සඳහා සූදානම්වීමට ගත යුතු ක්‍රියා මාර්ග

## 1. අවදානය ගැන දැනුවත් වන්න

- ගංවතුර ආරක්ෂාකාරී නොවන අතර මරණය ගෙන දිය හැක
- ගංවතුර මගින් දුරකථන මාර්ග, ජලය, විදුලිය, මළාපවාහනය සහ ගෑස් විසන්ධි විය හැක
- පළාතේ ගංවතුර ඉතිහාසය සහ උස ප්‍රමාණ සම්බන්ධයෙන් කවුන්සිලයෙන් සොයා බලන්න
- පළාතේ දීර්ඝ කාලයක් ජීවත්වූ අය සමඟ පළාතේ ඇති ගංවතුර අවදානම ගැන කථා කරන්න
- ධාරාණිපාත වැසි සහ ජල මට්ටම වේගයෙන් නැගීම වැනි ගංවතුර සම්බන්ධ සංඥා පුවරු සෝදිසියෙන් බලන්න
- විස්තර සඳහා NSW SES වෙබ් අඩවිය වන www.ses.nsw.gov.au වෙත පිවිසෙන්න

## 2. යා යුත්තේ කොහේද යන්න අවබෝධයෙන් සිටින්න

- ගංවතුර තුළට රිය පැදවීම, බයිසිකල් පැදවීම හෝ ඇවිදීම නොකරන්න. වඩා ආරක්ෂාකාරී මාර්ගයක් සොයා ගන්න
- ගංවතුර ප්‍රදේශවලින් බැහැරව සිටින මිතුරන් සහ නෑයන් සමඟ ඔවුන්ගේ නිවෙස්වල සිටිය හැකිද යන්න සම්බන්ධයෙන් කථා කරන්න
- ඔබ ප්‍රදේශයෙන් ඉවතට යාම අවශ්‍ය නම්, ඒ සඳහා ආරක්ෂාකාරීම ගමන් මාර්ගය සලකා බලන්න

## 3. කථා කල යුත්තේ කා හටද යන්න දැනගෙන සිටින්න

- ඔබගේ දුරකථනයේ හෝ ආසන්න ස්ථානයක ආපදා දුරකථන අංක ලැයිස්තුවක් තබා ගන්න
- ගංවතුර හෝ කුණාටු සම්බන්ධ ආපදා උපකාර සඳහා දුරකථන අංක 132 500 ඔස්සේ NSW SES අමතන්න
- ජීවිත තර්ජන ඇති අවස්ථාවල 000 අමතන්න (බිංදු තුන)

## 4. ඔබගේ සැලැස්ම අන් අය සමඟ බෙදා හදා ගන්න

- ඔබගේ පවුලේ අය සහ අසල්වාසීන් සමඟ ගංවතුර සම්බන්ධයෙන් සැලසුම් කරන්න
- ඔබට ව්‍යාපාරයක් ඇති නම්, ඔබ සමඟ ආසන්නයේ ව්‍යාපාර කරන අය සමඟ ගංවතුර සම්බන්ධයෙන් සැලසුම් කරන්න
- ඔබගේ සැලැස්ම නිතිපතා පුහුණු කරන්න

## 5. මූලික ආපදා කට්ටලයක් පිළියෙල කර ගන්න

- එහා මෙහා ගෙනයා හැකි බැටරිවලින් ක්‍රියා කරන ගුවන් විදුලි යන්ත්‍රයක්, විදුලි පන්දමක්, අමතර බැටරි, ප්‍රථමාධාර කට්ටලයක්, ඉටිපන්දම්, ජලයට ඔරොත්තු දෙන ගිනිකූරු, වැදගත් ලියකියවිලි, ආපදා සැලසුම්, ආපදාවකදී අමතන දුරකථන අංක සහ දිය කාන්දු නොවන බෑගයක් සමඟින් ආපදා කට්ටලයක් සූදානමින් තබා ගන්න
- පහසුවෙන් ගත හැකි තැනක එම කට්ටලය තබා ගන්න

## 6. ක්‍රියා කල යුතු අවස්ථාව දැන ගන්න

- කාලගුණ තත්වයන් හොඳින් පරීක්ෂාකර බලා ගන්න – ගංවතුර සම්බන්ධ අනතුරු හැඟවීම් කාලගුණ විද්‍ය කාර්යාංශය මගින් ලබාදේ www.bom.gov.au/nsw/warnings
- පිටත්ව යාම සම්බන්ධ නියෝගයන්ට අනුව කටයුතු කරන්න - එසේ නොකිරීමෙන් ඔබගේ සහ ඔබගේ පවුලේ අයගේ ජීවිත අවදානමට ලක්විය හැක

## 7. ඔබගේ රක්ෂණය සෝදිසි කර බලන්න

- බලන්න. රක්ෂණ ආවරණයක් ඇතිනම්, ඔබගේ තත්වය සහ අවදානම සම්බන්ධයෙන් එය සුදුසුද යන්න සොයා බලන්න

## 8. ඔබගේ පළාතේ ගුවන් විදුලි මධ්‍යස්ථානයට සවන් දෙන්න

- ආපදා අවස්ථාවකදී පළාතේ ඕස්ට්‍රේලියානු ගුවන් විදුලි සංස්ථාව (ABC) ආපදා සම්බන්ධ අනතුරු හැඟවීම්, තොරතුරු සහ යාවත්කාලීන ප්‍රචාරය කරනු ඇත
- ඔබට බැටරිවලින් ක්‍රියා කරන ගුවන් විදුලි යන්ත්‍රයක් ඇති බවට වග බලා ගන්න

Principal Partner

SES NSW STATE EMERGENCY SERVICE
(ප්‍රාන්ත ආපදා සේවය)

NRMA INSURANCE

**ගංවතුර සහ කුණාටු සම්බන්ධ උපකාර සඳහා ඇමතුම**

**132 500**

ජීවිත තර්ජන ඇති අවස්ථාවල 000 අමතන්න (බිංදු තුන)

**වැඩිදුර විස්තර සඳහා www.ses.nsw.gov.au වෙබ් අඩවිය වෙත පිවිසෙන්න**

#NSWSES /NSWSES /NSWSES